සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2018

**11 ශ්‍රේණිය**

# නාට්‍ය හා රංගකලාව - I

**කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකය: |
|---|

සැලකිය යුතුයි :

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

- **පහත දැක්වෙන පද්‍ය ආශ්‍රයෙන් අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - නමින් පසිඳු දඹදිව් තල පඬිපුර රජකළ නිරිඳුට
යොදුන් ගණන් අඹ උයනක් විය එහි මැද සැදුනු යසට
ඇසින් බලා බැරි නිමවනු රන්කඳ වෙයි ගහේ පාට
ගොසින් පතිනි එ අඹ ගසේ අඹයක පිළිසිඳ එම විට

B - නිරිඳුන්ගෙන් පොරණ
සිටින තනතුරු ලැබගෙන
නමින් බඩජලයෙන
බොළඳ මුක්කන් කුනෙක් දැන් එන

C - නොමඳ සිතුවිලි සීන බියකරු
බූත වෙස්ගෙන මා පෙළයි නිති
මාගෙ මව හා නැගිණියන් ගැන
සිතේ නිරතුරු ඇත රැඳී බිය

D - ගම්බිර තෙදැති කොන්ස්තන්තීනු පුරේ
පුරවර්ධන කරන අග නරනා මෙමන්

E - සුවඳ පද්ම ඕලු ආදී
නොයෙක පුෂ්පයෙන් සැදී
සරණ හංස සේරු බෝම
පොකුණු සීත පැන් පිරී

01 පහතරට ගැමි රංගයට අයත් පද්‍ය වන්නේ,

(1) A ය (2) B ය (3) C ය (4) E ය

02 ජෝන් ද සිල්වාගේ නූර්තියකට අයත් පද්‍ය වන්නේ,

(1) E ය (2) C ය (3) D ය (4) B ය

03 බැලසන්ත නාඩගමට අයත් පද්‍ය වන්නේ,

(1) C ය (2) B ය (3) D ය (4) E ය

04 ශාන්තිකර්මයකට අයත් පද්‍ය වන්නේ,

(1) E ය (2) C ය (3) D ය (4) A ය

05 එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍යකට අයත් පද්‍ය වන්නේ,

(1) A ය (2) B ය (3) D ය (4) C ය

- **අංක 06 සිට 10 තෙක් ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.**

06 ''නෘත්ත'' හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) සාත්වික අභිනය ප්‍රබල වේ. (2) ශිව පාර්වති, නර්තනය, මුද්‍රා උදාහරණ වේ.

(3) අංග වික්ශේප භාවිතා කරයි. (4) කිසියම් අර්ථයක් හෝ භාවයක් ප්‍රකාශ කරයි.

07 අංග රචනයේ මූලික බෙදීම වන්නේ,

(1) සරල අංග රචනය හා චරිතාංග අංග රචනයයි. (2) සෘජු අංග රචනය හා විකාරරූපි අංග රචනයයි.

(3) සෘජු අංග රචනය හා ඒකාකාරී අංග රචනයයි. (4) ලෝකධර්මී හා නාට්‍යධර්මී අංග රචනයයි.

08 රංග භූමියේ මූලික ලක්ෂණය වන්නේ,

(1) නවීන අලෝකකරණ පහසුකම් තිබීම (2) රඟපෑමට ප්‍රමාණවත් අවකාශයක් තිබීම

(3) පසුතල අලංකරණ එහාමෙහා කිරීමට හැකිවීම (4) සයික්ලොරාමා තිරයක් තිබීම

09 ක්ෂණික නිරූපණයක් මගින් නළුවාට ලැබෙන ප්‍රයෝජනයක් වන්නේ,

(1) පරිකල්පන හැකියාව වර්ධනය වීම. (2) මානසික හා ශාරීරික සැහැල්ලු බව

(3) නායකත්වයට හුරුවීම (4) ශරීරය සැහැල්ලු වීම

10 අනුකරණය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) චරිතයට ප්‍රවිශ්ඨ වීම (2) අභ්‍යන්තරව චරිතයක් අධ්‍යයනය කිරීම

(3) යම් චරිතයක් ඒ අයුරින්ම කර පෙන්වීම. (4) චරිතයක් පිළිබඳ ස්වයං නිරීක්ෂණය

- **පහත තොරතුරු ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A - නාට්‍යමය අවස්ථා අතර සම්බන්ධය රැක ගනී

B - දර්ශන මාරු කිරීමේ දී භාවිතා කරයි

C - ප්‍රේක්ෂක රස ජනනයට හේතු වේ

D - වේදිකා සමබරතාවය පිලිබඳ සැලකිලිමත් වෙයි.

E - විවිධ ප්‍රක්ශේපන යන්ත්‍ර භාවිතා කරයි.

F - නාට්‍යක ඇති සංචලන පදනම් කර ගනී

11 රංග වින්‍යාසය හා සම්බන්ධ වන්නේ,

(1) A හා D ය (2) D හා F ය (3) B හා E ය (4) C හා D ය

12 මෙහි රංගාලෝකය හා සම්බන්ධ වන්නේ,

(1) E හා F ය (2) A හා F ය (3) B හා E ය (4) C හා D ය

13 මෙහි සංගීතය හා සම්බන්ධ වන්නේ,

(1) B හා D ය (2) E හා F ය (3) B හා E ය (4) A හා C ය

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

14 ස්වභාවික චලන යනුවෙන් හැඳින්වන්නේ,

(1) එදිනෙදා ජීවිතයේ ආයාසයකින් තොරව සිදුකරනු ලබන ක්‍රියාවන්ය

(2) තම පරිකල්පන ශක්තිය මෙහෙයවා කරනු ලබන ක්‍රියාවන්ය.

(3) අනුකරණාත්මක චලන වේ.

(4) නිර්මිත ගණිතමය රටාවකට නිර්මාණය වූ චරිතයන්ය

15




ඉහත රූප සටහනේ A හා B යනු

(1) පින්තූර රාමු වේදිකාවේ ඉහළ වම හා පහළ දකුණය

(2) පින්තූර රාමු වේදිකාවේ මැද දකුණ හා ඉහළ වමය

(3) පින්තූර රාමු වේදිකාවේ පහළ දකුණ හා ඉහළ වමය

(4) පින්තූර රාමු වේදිකාවේ ඉහළ දකුණ හා පහළ වමය

- **පහත වගුව ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්වලට පිළිතුරු සපයන්න.**

| මුල් කෘතිය | රචකයා | අනුවර්තනය / පරිවර්තනය | පරිවර්තකයා / අනුවර්තකයා |
|---|---|---|---|
| රන් ෆෝ යුවර් වයිෆ් | ක | රෝමය ගිනිගනී | බන්දුල විතානගේ |
| ග්ලාස් මෙනාජරී | ටෙනසි විලියම්ස් | ග | හෙන්රි ජයසේන |
| රුඩන්ස් | ප් ලෝටස් | කබය | ජ |
| ට | ගාර්ෂියා ලෝකා | මූදු පුත්තු | ගුණසේන ගලප්පත්ති |
| ද ලෝවර් ඩෙප්ත් | ඩ | හිරු නැති ලොව | රංජිත් ධර්ම කීර්ති |

16 ඉහත වගුවේ ''ක'' කොටුවට අයත් වන්නේ,

(1) රේ. කුනි (2) ඇලෙක්සැන්ඩර් චැම්පිලොව්

(3) හෙන්රික් ඉබ්සන් (4) බර්නාඩ් ෂෝ

17 ඉහත වගුවේ '' ග'' කොටුවට අයත් වන්නේ,

(1) රන්ෆෝයුවර් වයිෆ් (2) රත්නාවලි (3) හිරු නැති ලොව (4) අහස්මාලිගා

18 ඉහත වගුවේ ''ජ'' කොටසට අයත් වන්නේ,

(1) සුගතපාල ද සිල්වා (2) හෙන්රිජයසේන (3) බන්දුල ජයවර්ධන (4) සුගතපාලද සිල්වා

19 ඉහත ''ට'' හි සඳහන් විය යුත්තේ,

(1) ග්ලාස් මෙනාජිරී (2) යෙර්මා (3) ගුඩ්වුමන් සෙට්ෂුවාන් (4) රුඩන්ස්

20 ඉහත ''ඩ '' කොටුවට අයත් වන්නේ,

(1) මැක්සිම් ගෝර්කී (2) ෂෝන් පෝල් සාත්‍රේ (3) රේ කැනි (4) බර්නාඩ් ෂෝ

- **පහත වගුව ඇසුරෙන් අංක 21 සිට 24 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| A | B | C | D |
|---|---|---|---|
| නරිබෑණා | මඟුල් ප්‍රස්තාව | මහාසාර | සීතල නදිය |
| දුන්න දුනුගමුවේ | පුදුම බෙරිල්ල | එකට මට හිනා හිනා | අයිරාංගනී |
| ජනේලය | හැංගිහොරා | හවකඩතුරාව | වනලිය |

21 විශ්ව විද්‍යාලයීය සිංහල සමිතිය මගින් රඟ දැක්වූ නාට්‍ය දැක්වෙන්නේ,
(1) A හිය (2) B හිය (3) C හිය (4) D හිය

22 60 -70 දශකයේ නාට්‍ය නිර්මාණ ඇතුළත් වන්නේ,
(1) C හිය (2) B හිය (3) A හිය (4) D හිය

23 මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ නාට්‍ය නිර්මාණ වලට අදාළ තීරුව වන්නේ,
(1) B හිය (2) A හිය (3) D හිය (4) C හිය

24 මිනර්වා නාට්‍ය නිර්මාණ වලට අදාළ තිරුව වන්නේ.
(1) D ය (2) C ය (3) B ය (4) A ය

- **පහත දැක්වෙන සංවාද ඇසුරින් 25 සිට 29 දක්වා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A - ඒයි ඔයාට සිංහල තේරෙන්නේ නෑ ඉංග්‍රීසියෙන් අහපත් යන්නෙ කොහාටද කියලා
B - මලේ රජ්ජුරුවන්ගේ උයන පාළු කරපු හූරා හොයා ගන්න.
C - ඔය එන්නේ යාපනේ භූමිකම්පාව වගේ කරකව කරකව
D - නාන්නේ නාමල් විලකින්

25 මෙහි ගර්භසංරක්ෂක ශාන්තිකර්මයක් හා සම්බන්ධ සංවාදයක් වන්නේ,
(1) A ය (2) B ය (3) C ය (4) D ය

26 මෙහි සුනියම් යාගය හා සම්බන්ධ වන්නේ,
(1) A ය (2) C ය (3) D ය (4) B ය

27 මෙහි උඩරට ශාන්තිකර්මයක් හා සම්බන්ධ වන්නේ,
(1) A ය (2) C ය (3) B ය (4) D ය

28 මෙහි සන්නියකුම යාගය හා සම්බන්ධ වන්නේ,
(1) C ය (2) D ය (3) B ය (4) A ය

29 දකුණු පස දැක්වෙන විදුලි පහන වන්නේ,
(1) ස්ට්‍රිප් පහනකි
(2) යොමු පහනකි
(3) ධාරා පහනකි
(4) වර්ණ චක්‍රයකි



- **පහත දැක්වෙන වෙස් මුහුණු ඇසුරෙන් අංක 30 සිට 31 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A




B



30 මෙහි දැක්වෙන වෙස් මුහුණු අතරින්
(1) "A" සන්නි මුහුණකි "B" කෝලම් මුහුණකි. (2) "B" සන්නි මුහුණකි "A" කෝලම් මුහුණකි
(3) "A" හා "B" සන්නි මුහුණු දෙකකි (4) "A" හා "B" කෝලම් මුහුණු දෙකකි

31 මෙහි දැක්වෙන වෙස් මුහුණු දෙක,

(1) "A" නාග සන්නිය හා "B" පොලිස් කෝලම (2) "A" පොලිස් කෝලම හා "B" ගොළු සන්නිය

(3) පොලිස් කෝලම හා "B"කණ සන්නිය (4) "A" හේවා කෝලම හා "B" බිහිරි සන්නිය

- **පහත දැක්වෙන ඡායාරූප ඇසුරින් අංක 33 සිට 37 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**


ක


ග


ජ


ට


ඩ

32 ටීටර් නාට්‍ය නිර්මාණකරණයෙන් ප්‍රසිද්ධියට පත්වූයේ

(1) ''ඩ '' ය (2) ''ජ'' ය (3) ''ග '' ය (4) ''ට'' ය

33 වැනිසියේ වෙළන්දා නාට්‍යයෙන් රංගනයට ප්‍රවිශ්ඨ වූයේ

(1) ''ජ'' ය (2) ''ග '' ය (3) ''ඩ '' ය (4) ''ක '' ය

34 මහාවංශයේ එන කතා පුවතක් ඇසුරෙන් නාට්‍යයක් නිර්මාණය කළේ

(1) ''ක '' ය (2) ''ග '' ය (3) ''ජ '' ය (4) ''ට '' ය

35 ඉංග්‍රීසි නාට්‍යයන්හි රූපණය හා සම්බන්ධ වන්නේ,

(1) ''ක '' ය (2) ''ජ '' ය (3) ''ග '' ය (4) ''ට '' ය

36 විකෘති නාට්‍ය නිර්මාණය හා සම්බන්ධ වන්නේ,

(1) ''ඩ '' ය (2) ''ජ '' ය (3) ''ග '' ය (4) ''ට '' ය

- **අංක 37 සිට 39 දක්වා නොගැලපෙන පිළිතුර තෝරන්න.**

37 කෝලම් නාට්‍යයන් හි

(1) හාස්‍යෝත්පාද පූර්ව රංගයක් ඇත

(2) වෙස්මුහුණු දැමීමට සුවිශේෂ වේ

(3) වෙස් මුහුණු කුඩා වී ඇති නිසා හඬ ප්‍රක්ශේපනය පහසුය

(4) එදා සමාජ නිලධාරි පැලැන්තිය විවේචනය කර ඇත

38 නාඩගම් හා නූර්ති රචකයන්ය

(1) පේදුරු සිංඤෝ, චාල්ස් ඩයස් (2) මෝදර පැලිස් අප්පුහාමි, ජෝන් ද සිල්වා

(3) සිරිසේන විමලවීර එඩී ජයමාන්න (4) චාල්ස් ආබ්‍රෙව් හා දොන්බස්තියන්

39 කෙටි නාට්‍ය නිර්මාණයක

(1) සීමිත චරිත ඇති අතර ඒකාංගික වේ

(2) දීර්ඝ කතා කෙටිකර කෙටි කාලයක් තුළ රඟ දක්වයි

(3) බොහෝ චරිත ඇති අතර අංකයන් කෙටිය.

(4) කතන්දරයක් කෙටි කිරීම සහ චරිත වැඩිපුර දැකගත හැකිය

40 '' අස්ප ගුඩුං'' නාට්‍යයේ රඟපාමින් වේදිකා නාට්‍ය කලාවට ප්‍රවේශ වූවා සේම සිනමාව තුළද සුවිශේෂ නිර්මාණයන්හි දායකත්වයක් දක්වා ඇති නාට්‍ය වේදියා වන්නේ,

(1) නිශ්ශංක දිද්දෙනිය (2) ජැක්සන් ඇන්තනි (3) රවීන්ද්‍ර යසස් (4) ජයලත් මනෝරත්න

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2018
# නාට්‍ය හා රංගකලාව - II

11 ශ්‍රේණිය | කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01) දික්තලා කාලගෝල නාට්‍ය පෙළ ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- i. මෙම නාට්‍ය පළමුවරට වේදිකා ගත කරන ලද්දේ කවදාද ? (ල. 02)
- ii. මෙම නාට්‍ය නිර්මාණයට පාදක කරගත් දේශීය රංග සම්ප්‍රදාය කුමක් ද? (ල. 02)
- iii. දික්තල කාලගෝල නාට්‍යයේ රංග සම්ප්‍රදායේ ලක්‍ෂණ මොනවා ද? (ල. 02)
- iv. දික්තලා කාලගෝල නාට්‍ය රචනා කිරීමට පදනම් වූ මූල බීජය කුමක් ද? (ල. 02)
- v. මෙම නාට්‍යයේ ප්‍රධාන ගැටුම කුමක් ද? (ල. 02)
- vi. මෙම ගැටුම විසඳන ආකාරයෙන් ජීවිතයට ගත හැකි ආදර්ශ මොනවා ද? (ල. 02)

(02)
- i. ප්‍රාසාංගික කලාව යන්න නිර්වචනය කරන්න. (ල. 02)
- ii. ප්‍රාසාංගික කලාවේ සුවිශේෂී ලක්‍ෂණ මොනවා ද? (ල. 04)
- iii. නාට්‍ය කලාව හැර ඔබ දන්නා ප්‍රාසාංගික කලා අංග දෙකක් විස්තර කරන්න. (ල. 06)

(03)
- I. අභිනය යන්න හඳුන්වන්න (ල. 02)
- ii. නළුවාගේ සමාරෝපය සඳහා අභිනය උපකාරීවන ආකාරය දක්වන්න. (ල. 04)
- iii. නාට්‍යධර්මී හා ලෝකධර්මී රංග ශෛලීන් දෙක වෙන් වශයෙන් විස්තර කරන්න. (ල. 06)

(04)
- i. රංග අභ්‍යාස යනු කුමක් ද? (ල. 02)
- ii. ඔබ සිදුකරන ලද රංග ක්‍රීඩා දෙකක් විස්තර කරන්න. (ල. 04)
- iii. ආධුනිකයෙකුට රංග ක්‍රීඩා සහ රංග අභ්‍යාසවල අවශ්‍යතාවය පැහැදිලි කරන්න. (ල. 06)

(05)
- i. කෝලම් යන්නෙහි අරුත පහදන්න. (ල. 02)
- ii. කෝලම් රඟ මඩලට පැමිණෙන අනුපිලිවෙල සඳහන් කරන්න. (ල. 04)
- iii. කෝලම් රංගන ශෛලියේ ලක්‍ෂණ පැහැදිලි කරන්න. (ල. 06)

(06)
- i. උඩරට ප්‍රධාන ශාන්තිකර්මය නම් කර පැවැත්වීමේ අරමුණු සඳහන් කරන්න. (ල. 03)
- ii. එහි දැකිය හැකි නාට්‍යමය අන්තර් රංගන අවස්ථා මොනවා ද? (ල. 04)
- iii. එම රංගන අවස්ථාවක නාට්‍යමය ලක්‍ෂණ විස්තර කරන්න. (ල. 05)

(07) කාර්යාලයක ලිපිකරුවකු වූ කරුණාරත්න මැදිවියේ පසුවන්නෙකි. ඔහු කාර්යාලයේ කිසිදු උත්සවයකට හෝ දානමය කටයුත්තකට සහභාගී නොවී කවුරුන් හෝ අත සුළු ත්‍යාගයක් හෝ එසේත් නොකරන අවස්ථා වලදී ටෙලිග්‍රෑම් එකක් යවයි. ඔහු පවසන්නේ වැඩ අධික බවයි. එක් දිනක් ඔහු කාර්යාලයේ වැඩ කරමින් සිටින අතරතුර ඔහුට දුරකථන ඇමතුමක් එයි. මෙම සිදුවීම සමබන්ධ කර චරිත සංවාද රංග විධාන නාට්‍යෝචිත අවස්ථා යොදා ගනිමින් නාට්‍ය පෙළක් නිර්මාණය කරන්න. (ල. 12)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(2) | 2 -(1) | 3 -(3) | 4 -(1) | 5 -(1) | 6 -(3) | 7 -(1) | 8 -(2) | 9 -(1) | 10 -(3) |
| 11-(2) | 12 -(3) | 13 -(4) | 14 -(1) | 15 -(3) | 16 -(1) | 17 -(4) | 18 -(3) | 19 -(2) | 20 -(1) |
| 21-(2) | 22 -(3) | 23 -(4) | 24 -(1) | 25 -(4) | 26 -(1) | 27 -(3) | 28 -(1) | 29 -(1) | 30 -( ) |
| 31-( ) | 32 -(2) | 33 -(3) | 34 -(2) | 35 -(1) | 36 -(4) | 37 -(3) | 38 -(3) | 39 -(1) | 40 -(4) |

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) I. 1975 ජනවාරි 20
ii. නාගඩම් සම්ප්‍රධාය
iii. පොතේ ගුරු පූර්ණ විරිදුව ගායනා කිරීම / ගායක පිරිස තෝඩායම ගායනය කිරීම / පූර්ව රංගයේ දි බහුබුතයා පැමිණීම / මංගලම් සිංදුව
iv. උම්මග්ග ජාතකයේ කාලගෝල ප්‍රශ්නය
v. කාලගෝලයා දික්තලා සමග යන අතරමගදී දික්පිටියා හමුවී ඔහු සමග සිදු කෙරෙන ගැටුම හා සම්බන්ධ සිදුවීම
vi. නොගැලපෙන මිනිසුන් ජීවිතයට සම්බන්ධකර නොගත යුතුයි යනාදී ලෙස පිළිතුර ගලපා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(02) I. ගායනය, වාදනය, චලනය පදනම් කරගනිමින් ශිල්පියා ගේ පෞරුෂය මැනවින් හසුරුවා ගනිමින් වේදිකාව මත කෙරෙන අර්ථ ප්‍රකාශනය හා භාව ප්‍රකාශනයයි.
ii. සජීවී බව, ඍජු ප්‍රේක්ෂක සම්බන්ධතාව, අනුෂාංගික කලා සුසංයෝගය, සතර අභිනය භාවිතය ආදී විශේෂ ලක්ෂණ සඳහන් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.
iii. උදාහරණ දක්වමින් විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(03) i. නළුවන් ප්‍රේක්ෂකයා අතරට ගෙනයන මාධ්‍යයයි. අභි+ නය ඉදිරියට ගෙන යාමයි.
ii. අභිනය උපකාරී වන ආකාරය සඳහක් කර ඇත්නම් ලකුනු දෙන්න.
iii. නාට්‍යධර්මී ලක්ෂණ - සංවාද පද්‍ය මෙන්ම ගද්‍ය ස්වරූපයෙන් ද දැකිය හැකි වීම / වේදිකාව මත වටයක් ගමන් කිරීමෙන් එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට යන බව හැඟවීම / සංගිතය බහුල ලෙස යොදා ගැනීම / තාලානුකූල ගමන් රටාව / සම්මත මුද්‍රා භාවිතය ආදී ලෙස ලියා ලෝකධර්මී ස්වභාවයත් ලියා ඇතනම් ලකුණු ලබා දෙන්න.

(04) i. ආධුනික නළුවාගේ ශාරීරික හා මානසික සමබරතාවය ඇතිකර ගැනීම සඳහා සිදු කරනු ලබන අභ්‍යාසයන්ය.
ii. අංක ක්‍රීඩාව, ආච්චිගේ යතුර, බල්ලා හා මස් කටුව, රාස්සයෙක් ගමට ඇවිත්
iii. අවශතාවය පැහැදිලිව ප්‍රකාශ කරයි නම් ලකුණු ලබා දෙන්න.

(05) i. නළුවා පළඳිනු ලබන වේෂය යන්නයි
ii. අනුපිළිවෙළ සඳහන් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.
iii. සංකීර්ණ වෙස් මුහුණු පැළඳීම, පිරිමින් පමණක් රංගනයේ යෙදීම, කාරිය කරවන රාළ හෙවත් සබේ විදානේ චරිත හඳුන්වා දීම, ආදී ලෙස කරුණු විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(06) i. කොහොඹා කංකාරිය / සශ්‍රීකත්වය හා සෞභාග්‍ය ඇති කර ගැනීම
ii. ගුරුගේ මාලාව, යක්කම් පහ, දාන පහ
iii. විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(07) i. නාට්‍යමය අවස්ථා නිර්මාණය කිරීම (ල. 04)
ii. සංවාද රංගවිධාන සහිතව පෙළ රචනා කිරීම (ල. 08)